මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| සිංහල සාහිත්‍ය රසාස්වාදය | 10 ශ්‍රේණිය | කාලය : පැය 03යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ...........................................................................

සැලකිය යුතුයි. i කොටසෙහි 1,2 ප්‍රශ්න වලටත්, ii කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, iii කොටසෙහි 4,5,6,7 ප්‍රශ්න වලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් උත්තර සපයන්න.

## I කොටස

01. අංක i සිට v දක්වා කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

I. "එඹල ඒ තට අතවැසිකමට නිසි එකෙක් නොවෙයි. ඇදුරුකමට නිස්සෝය. තෝ මෙතැන් පටන් උන්ගෙන් ශිල්ප උගනුව"

අ. මෙම ප්‍රකාශය කවුරුන් කියූවක් ද?

ආ. මෙහි "උන්ගෙන්" යනුවෙන් අදහස් කළේ කවුරුන්ව ද?

II. පරසිඳු පබු දනන් සෙවි පමණින් මහරු
බෙලෙනිඳු මඳ වුවත් නොකෙරෙති රුපුන් සරු
බරණිඳු ගෙල වසන නා රඳ වෙමින් ගරු
ගුරුළිඳු අතින් ඇසි කිම යහළු තොරතුරු

අ. මෙහි පැවසෙන අදහස කෙටියෙන් පවසන්න.

ආ. මෙම කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය රචනා කළේ කවුරුන්ද?

III. "කටේ හැටි කිරි අප්පුගෙ හොඹු කට වගෙයි" මම කීමි.

අ. මෙසේ කීවේ කාහටද?

ආ. මේ කතාව නිර්මාණය කළේ කවුරුන්ද?

IV. ලත් පමණට මැටි ඉදි කරවා ගෙන
චිත් බැඳලා කළගෙඩි තනවා ගෙන

අ. මෙම කවිය සම්පූර්ණ කරන්න.

ආ. මෙම කවිය කුමන කවි වර්ගයට අයත්ද?

V. "අන්න අරහෙ කඩේට වෙලා බුදි" මාටින් දෙකට තුනට නැමෙමින් කියයි.

අ. මෙම පාඨය උපුටා ගත් කතාව කුමක්ද?

ආ. මෙම කතාවේ රචකයාගේ වෙනත් නිර්මාණයක් නම් කරන්න.

(ලකුණු 04 X 05 = 20)

02. පහත දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොටගෙන රසාස්වාදයක් ලියන්න.

1. නැගෙතත් අවර ගිරගින් දිනකර මඬල
සැලෙතත් සුනෙර පවනින් සෙදෙතත් අනල
පිපෙතත් ගිරි මුදුන හෙල් මැලි පියුමුපුල
බොරු නැත්තෙමය මහතුන් පැවසු තෙපුල

2. කොතෙක් වෙහෙස ලදුවත් සුදනෝ පවර
උදක් ලොව සතුන් සිත දුක් කෙරෙති දුර
පසක් රාහු මුවපත් වෙමිනි බිය කර
අනික් පසින් ලොව හෙළි කෙරෙය හිමකර

3. පින්මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණනැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු
එක පුන් සඳින් දුරුවෙයි ලොව ගන අඳුරු
නෙක තරු රැසින් එලෙසට නොමවේය දුරු

4. විපුල ගුණැති මහතුන් හට පත් විපත
නිසල නැණින් යුතු උතුමෝ ම දුර ලත
කලල ගිලුණු මත වරණිඳු ගොඩ ගනුත
තුමුල බලැති ගිජිඳකු මිස අන් කෙවත

5. කුලුණු ගුණින් යුතු උතුමන් සිත මහරු
දුදන බසින් නොයෙදෙයි කරනට නපුරු
නව රුවනින් පිරි මහ සමුදුර ගැඹුරු
තණ සුළකින් උණු කල හැකි වෙති කවුරු

I. මෙම කවි අයත් වන්නේ කුමන කාව්‍ය ගණයට ද?
II. මෙම පද්‍ය රචනා කිරීමේ අරමුණ ලෙස කෘතියේ දක්වා ඇත්තේ කුමක් ද?
III. ඒ සඳහා යොදා ගත් උපමා අලංකාර කොතෙක් දුරට ගැළපේ ද?
IV. මෙම කවි සාමාන්‍ය ජනතාව අතර බොහෝසෙයින් ජනප්‍රිය වීමට බලපෑ හේතුව කුමක් ද?
V. වෙනත් පොත් වලින් අදහස් ලබා ගත්තද කවියා තම ස්වාධීන කාව්‍ය ප්‍රතිභාව ඉස්මතුවන ආකාරයෙන් ඒවා ඉදිරිපත් කර ඇති ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 25)

## II කොටස

03. පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකින් එක කොටසකට පමණක් උත්තර සපයන්න.

බෝධිසත්වයෝ නැවත නැවතත් ඇවිටිලි කොට කිවුය. එකල මෑණියෝ "දක්නා කැමත හොත් ඇත්හලට ගොස් ඇත්ගොව්වන් හා එක්ව සිටුව, මම එතැනට කැදවාගෙන එමි. එකල ඇස් පුරා දැක පියව, තොප වූ නියාව නොහඟවා" යි කිවුය. බෝධිසත්වයෝත් යහපතැයි පිළිගෙන ඇත්හලට ගියාහුය. එකල්හි සීලවතී දේවී ප්‍රභාවතීන් ඇත්හලට කැඳවා ගෙන ගොස් මේ අසවල් ඇතා ය. මේ අසවල් නම් ඇතා යයි නම් කිය කියා දක්ව දක්වා යන සඳ කුස රජ්ජුරුවෝ ප්‍රභාවතීන්ගේ පිට ඇත් ඉලත්තියක් ගැසුහ. එකල ප්‍රභාවතී "රජ්ජුරුවන් වහන්සේට කියා තොපගේ අත කප්පාලමි" යනාදීන් කියා බිසවුන් ලවාත් කෝප කැරවුය, එසඳ බිසවු ප්‍රභාවතීන්ගේ පිට අතින් පිරි මැද "මේ ඇත්හල කොල්ලෝ නම් ඉතා චපලයෝය. නුඹ වහන්සේට උරණවන්නෝ ය" යි යනාදීන් කියා අස්වසා රජගෙට ගියහුය.

I. මේ උද්ධෘතය ඇසුරින් කුස චරිතය පිළිබඳව ඔබට හැගෙන හැඟීම විස්තර කරන්න. (ල. 05)
II. මේ කොටස ඔබේ සිත තුල මවන චිත්ත රූපය කෙබඳු දැයි පැහැදිලි කරන්න. (ල. 05)
III. ජාතක කතාතරු යොදාගත් භාෂාව මෙම කතාව පාඨකයාට සමීප කිරීමට කොතරම් දුරට ඉවහල් වූයේ දැයි පැහැදිලි කරන්න. (ල. 10)
IV. ප්‍රභාවතීගේ චරිතය තුළින් සාමාන්‍ය කාන්තාවන්ගේ චරිත ලක්‍ෂණ හෙලිවන බව මෙම උද්ධෘතය ඇසුරින් විස්තර කරන්න. (ල. 05)

නැතහොත්

රිදියෙන් තනලා රත්රන් ඔබලා
කැරලි කෙටුවයි දෑකැත්තේ
සුරතට රන්වන් ගලි නංවාලා
කදිමට දිලිසෙයි දෑකැත්තේ
අඩියෙන් අඩියට තාල කියන්නට
සබයෙන් අවසර ලැබගන්නේ
සතරවරම් දෙවියන්ගේ බලයෙන්
ගොයම් කපමු අපි දෑකැත්තේ

ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත ඉරිදා පායන ඉර වාගේ
සඳට සඳක් නැත මෙහෙම සඳක් නැත සඳුදා පායන සඳ වාගේ
දියට දියක් නැත මෙහෙම දියක් නැත කැලණි ගඟ් දියවර වාගේ
කෙතට කෙතක් නැත මෙහෙම කෙතක් නැත ගොයම් නෙළන මේ කෙත වාගේ

ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක්දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන් දෙවියනේ වෙල බත් බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ

බෝඹු ඉදල දලු ලා දෝ නො ලා දෝ
කෙකටිය මලේ වක යා දෝ නො යා දෝ
කැලණි ගඟේ ඔරු යා දෝ නො යා දෝ
කළුගෙ නගා මෙහි ඒ දෝ නො ඒ දෝ

කන්ද උඩින් එන කිකිළිය ගෝමරියේ
නළල් වටින් එන දාඩිය මුතු කැටියේ
අත පාමුදු පය පාමුදු වයිරොඩියේ
මට පිටුපා ගෙට යනවද සුරතලියේ

අල්ලා ගෙන නෙරිය අතකින් කිම් ද නගෝ
වසාගෙන දෙතන අතකින් කිම් ද නගෝ
හිමියෙක් නැති ගමන් තනි මඟ කිම්ද නගෝ
අම්බලමේ ඉඳලා අපි යම් ද නගෝ

I. ජන කවියට ගැමියාගේ අත්දැකීම් පාදක වූ බව පෙන්වා දෙන්න. (ල. 05)
II. සරල බව ජන කවියේ ප්‍රධාන ලක්‍ෂණයක් බව පැහැදිලි කරන්න. (ල. 05)
III. සංයමයෙන් යුක්තව අදහස් ප්‍රකාශ කිරීම ජන කවියේ අපූර්වත්වයට හේතු වී ඇත්තේදැයි විමසන්න. (ල. 05)
IV. ජන කවියෙහි ඇති විවිධත්වය අගය කරන්න. (ල. 10)

# III කොටස

මෙම කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් උත්තර සපයන්න.

(එක් උත්තරයක වචන 150 ක් වත් තිබිය යුතුයි.)

04. කුස ජාතකය පාඨක ශ්‍රාවක සිත් තුළ හාස්‍ය රසය ජනනය කරන කතා වස්තුවකි. නිදසුන් තුනක්වත් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ල. 15)

05. ළමා සිතිවිලි හා ළමා මනස ක්‍රියාකරන අන්දම වෙසක් පහන කෙටි කතාවේ මනාව නිරූපණය කෙරේ. නිදසුන් තුනක්වත් යොදා ගනිමින් විමසන්න.

(ල. 15)

06. තුංමං හන්දිය නව කතාවේ ලොකු මාමාගේ චරිතය පිළිබඳ විවරණයක් කරන්න. නිදසුන් තුනක්වත් තිබිය යුතුය.

(ල. 15)

07. "සුභාෂිත කතුවරයා පරිසරයේ ඇති අජීවී වස්තු උපයෝගී කරගෙන මිනිස් සිත විවරණය කර ඇති ආකාරය අපූරුය." මෙම කියමන සනාථ කිරීම සඳහා නිදසුන් තුනක්වත් දෙමින් විස්තර කරන්න.

(ල. 15)